# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 10
NUMBER 10

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JANUARY 10, 2008 ජනවාරි මාසය (බුද්ධ වර්ෂ 2551 දුරුතු මාසය)




බෙනාසීර් භූතෝ Benazir Bhutto ( 1953 - 2007 ) - former Prime Minister & Opposition Leader of Pakistan

දෙස් පාලනය සුදුසුද ගැහැණියක හට
තිස් සෙම අසන කරුණකි ලොව හතර වට
නිශ්චිත පිළිතුරක් සොයමින් සිටින විට
ගැස් සුණු පුවතකින් ඔබ පත් මරු මුවට

සැනෙකින් ලෝ පුරා එපුවත් ගියෙ විහිදී
දුකකින් ඇලලුණේ ලොව පෙර නූ පරිදී
එලෙසින් දිවි ගමන අවසන් කළෙ මගදී
තිරිසන් දේසපාලන ක්‍රමයයි වැරදී

පිරිමින් සමව ගෙන දිරි නිබයව නිතින
හිඳිමින් රැපුන් අතරේ නොසැලෙන සිතින
වදනින් මිහිරි රැසිරෙන් දුටු නෙත බඳින
වෙනයම් කතක් වෙද ඔබ සරිවන කොතැන

පෙර දිග අපර දිග එක ලෙස හුරු වෙමිනී
පෙර දිග ගැහැණු සංවරකම රැකි සොඳිනී
කර දර ගැහැට ගැරහුම් දහසක් පැමිණී
ඉරණම මෙලෙසයයි ඉඟියක් වත් නොවුණී

කුමක් වුවද ගිය දෙස් පාලන ගමන
යමක් දුටිමි මැනවින් ඔබ නැති බැවින
සඳක් දිලුන පෙරදිග අහසෙහි රැවින
දිනක් එසඳ බැසගියෙ නොම එන ලෙසින

නෙතේ බැල්ම හසුවන සිතට හී සැරා
වෙතේ වදන් තෙපලන කනට මී යුරා
නැතේ දකිනු ඔබ සා ළඳුන් එඩි තරා
සිතේ සොවකි ඔබ ගැන මතක ඇති තුරා

♦ දයා ආනන්ද රණසිංහ

# හරිමග ඔස්සේ 2008 →

සංජය විමලරත්න විසිනි

**මෑ**ත දිනවල අප රටින් ලද විවිධ ආරංචි විමසා බලනවිට ඛේදජනක දේවල් මෙන්ම, ඉදිරි ගමනක සුබ නිමිතිද පෙනී යයි. යුද පෙරමුණෙන් සුබ ආරංචි ලැබෙනවා මෙන්ම පරාජයෙන් වියරු වී ඇති කොටි කොළඹ නගරය ඇතුළු ජනාවාස ප්‍රදේශවල පරණ බෝම්බ සෙල්ලම යළ අරඹා ඇත. තැනින් තැන සටන් ජයග්‍රහණයන් ගැන ලැබෙන ආරංචි අනුව අපේ වීරෝදාර හමුදා සටන උතුරටම ගෙනගොස් ඇති බව පෙනී යයි. විශාල ආයුධ තොගයක් හොරෙන් ගෙන එමින් සිටි කොටි නැවක් සහ එයට අරක්ෂාව සපයමින් සිටි සහාය යාත්‍රා සියල්ලම විනාශ කොට ගිල්වා දැමීම අප ගුවන් සහ නාවික හමුදා මෑතකදී ලද විශාල ජයග්‍රහණයකි. මෙය කොටි පසුබැස්සවීම සඳහා දුන් ප්‍රබල පහරක් සේම අප හමුදාවන්ගේ කැපවීම පිළිබිඹු කරයි. ඉලක්කය අනුව කිලිනොච්චියටම ගොස් මහ කොටියා සැඟවී ඇති තැනටම පවා පහරදීම ම මේ ප්‍රහාර නිසි පරිදි මෙහෙයවන බවේ ලකුණකි. හමුදාපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදා නායකයින්ද යුද්ධය නුදුරු අනාගතයේ දී ම ජයග්‍රහණය කරා මෙහෙයවීමට නිසි නායකත්වය දෙමින් සිටිති. එසේ ම ජනාධිපතිතුමා ඇතුළු පාලකයින් ද සටනට අද නිවැරදි දේශපාලන නායකත්වය දෙමින් මෙහෙයවනු දැක්ම සතුටට කරුණකි.

ජාත්‍යන්තර සම්බන්ධතා පැත්තෙන් බලන විටද පෙනී යන්නේ අප රජය සතුරන් හා මිතුරන් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරන බවයි. සති කීපයකට පෙර ජනාධිපතිතුමාගේ ජපාන නිල සංචාරයේදී අප රටට යෙන් බිලියන දෙකක ආධාර ලැබෙනා තවත් ගිවිසුමකට අත්සන් තැබිණ. ජපානය ද අර ටික කලකට පෙර 'සාම කටයුතු' යටතේ අප රටට ආධාර ලබාදීම ක්‍රියාත්මක කළ කණ්ඩායමේ සාමාජික රටකි. එම කණ්ඩායමේ අනෙක් සාමාජිකයින් අතරවූ ඇමරිකාව බ්‍රිතාන්‍යය ආදී රටවල් මෑතකදී අපට සාමාන්‍යයෙන් දුන් ආධාරද කපා දමා කෙණෙහිලිකම් කළහ. එසේ කරන ලෙස ජපානයටද බලපෑම් කරන්නට ඇතැයි සිතේ. නමුත් මේවා ගණන් නොගෙන අපේ නියම මිතුරෙකු සේ එම රටින් දෙන ආධාර නොවලහා ලබා දිණ. ඇමරිකාව බ්‍රිතාන්‍ය ආදි රටවල් මොන විධියකින් හෝ ඉරානයට පහරදීමට අර ඇන්දද, අපගේ තේ වලට හොඳ වෙළඳ පොළක් ලබා ගැනීම සඳහාද අප ඉරානය සමග කිට්ටු සබඳතා ගොඩනගා ගැනීමද තව පැත්තකින් ජාත්‍යන්තර වශයෙන් ගත් ඉදිරි පියවරකි.

අසල්වැසි පකිස්ථානය සමගද අප යුද මෙහෙයුම් සඳහා අවි ආයුධ, තාක්ෂණික උපකරණ ආදිය සඳහා ටික කලක සිටම ගනුදෙනු පැවතිණ. දැනුදු එම සබඳතා එසේම පවත්වාගෙන යන අතර තව ඉදිරි පියවරක් මෑතකදී ගනිමින් එහි ගුවන් හමුදා පුහුණු ආයතන වල අප ගුවන් හමුදා සෙබළුන් පුහුණු කරන වැඩ පිළිවෙලක් අළුතින් අරඹා ඇත. එසේම අපේ අසල්වැසි ඉතා සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින මැලේසියාව සමගද තාක්ෂණික හා වෙළඳ සබඳතා දැන් ටික කලෙක සිට ක්‍රියාත්මකව ඇත.

විශේෂයෙන් සඳහන් නොකළද, අප ළඟම මෙන්ම පැරණිම හිතමිතුරන් වන ඉන්දියාව සහ චීනය සමග කවදත් තිබුණ පරිදි ඉතා කිට්ටු ප්‍රබලම සබඳතා එසේම පවතී. මේ රටවල් දෙකම අද ආසියාවේ පමණක් නොව මුළු ලෝකයේම පවා ආර්ථික බලවතුන් බවට පත්ව සිටිති. ඇමරිකාව, බ්‍රිතාන්‍යය සහ යුරෝපා අක්ෂය වටා කරකැවෙමින් පැවති ලෝක ආර්ථික බලය, චීනය, රුසියාව, ලතින් ඇමරිකාව සහ ඉන්දියාව ආදී රටවල නව ආර්ථික දියුණුව හේතුවෙන් නොබෝ කල් යාමට පෙර එම රටවලින් සමන්විත නව අක්ෂයක් වටා කැරකෙන තැනට පත්වනු ඇතැයි ආර්ථික විද්‍යාඥයින්ගේ මතය වෙයි. අපට හිතදායී අසල්වැසියන් සේම නියම මිත්‍රයින්ද හඳුනාගෙන එම සබඳතා තහවුරුකර ගැනීම අප අද යන නිවැරදි මග පෙන්වයි.

***දැනට වසර 6 කට පමණ පෙර රනිල් වික්‍රමසිංහ මහතා කෙටි කාලයකට අටවා ගත් ආණ්ඩුව විසින් රට පාවා දෙමින් අත්සන් කරන ලද ඊනියා සටන් විරාම ගිවිසුම ඊයේ පෙරේදා වර්තමාන රජය විසින් නිශ්ක්‍රිය කිරීමද මේ ඉදිරි ගමනේ අළුත්ම, එසේම වැදගත්ම ඉදිරි පියවරකි.***

එදා ඒ ජාති ද්‍රෝහි පිරිස ධනපතියන්ගේ බඩජාරී වාසිය සඳහා අප ජාතියේ බෙල්ලට දැමූ මේ මළපුඩුව ගලවා හැරිය යුතුව තිබුණේ වසර කීපයකට පෙරය. එයින් ඇතිවූ සටන් විරාමයක්ද නැත. ඇමරිකාවට සහ බ්‍රිතාන්‍යයට වැඳවැටෙන අධිරාජ්‍ය ගැති අප රටේ සමහර ධනපති කණ්ඩායම් සහ දේශපාලනඥයෝ මෙය යටතේ බිලියන ගණන් වලින් ආධාර වාසි අපේක්ෂාවෙන් පසුගිය වසර කීපය තුළ කොටි සමග ඒ සාම නාඩගම නැටූහ. නෝර්වේකාරයෝ අපට සාමය දෙන්නට මේ නාඩගමේ පිටපත ලියා අප මෙහෙය වූහ. සොල්හයිම් එහි පොතේ ගුරා වීය. අපේ සමහර දේශපාලකයෝද මේ අනුව යමින්, අඳුරේ අතපතගාමින් සාමය සෙවූහ. මේ සියල්ලේම වාසිය ලැබුයේ ත්‍රස්තවාදී කොටි පිරිස බව අද මුළු රටම දනී. දැන්වත් ඇස් ඇරී, නියම මග දැක, ප්‍රමාද වී හෝ මෙම නිශ්ඵල ගිවිසුම අහෝසිකිරීම අප රටේ වාසනාවකි. මේ සමග නෝර්වේකාරයින්ට ද ගම රට බලා යන්නට බල කළ යුතුය.

මේ පියවරට විරුද්ධව බ්‍රිතාන්‍යය, ඇමරිකාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව නෝර්වේ රටවලින් අපට අප්‍රසාදය පලකෙරෙනු ඇත.

3 වෙනි පිටුව බලන්න →




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරී,
සුබ නව වසරක් වේවා!

MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3